දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் – ஹம்பாந்தோட்டை

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"For a prosperous future"

1 වන මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට.
1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

මගේ අංකය / My No } DSH/DPS/07/DCC/වාර්තා/2024 } ඔබේ අංකය

දිනය / Date } 2025.02.06

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

**<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම වාර්තාව - *2025.01.29*</u>**

2025.01.29 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටුකිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතනවල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථාවලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03.ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටුකිරීම පිළිබඳ ප්‍රගතිය දින *07* ක් ඇතුළත මා වෙත *DCC Hambantota WhatsApp* වෙත හෝ *dpshambantota@gmail.com* වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04.තවද, මෙම වාර්තාව *www.hambantota.dist.gov.lk* දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබා ගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

**බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා**
**දිස්ත්‍රික් ලේකම්/දිසාපති**
**හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.**

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

පිටපත්:-
01 දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර එම්.කේ.බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමා - කරු.දැ.ගැ.ස.
02 හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා -කරු.දැ.ගැ.ස
03.ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
04.ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - දැ.ගැ.ස

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් / மாவட்ட செயலாளர் / District Secretary — 047 2256235 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(පාලන) / Nkyjpf khtl;l nrayhsu; (epu;thfk;) / Additional District Secretary (Admin) — 047 2256232 | අතිරේක දිස්ත්‍රික් ලේකම්(ඉඩම්) / Nkyjpf khtl;l nrayhsu; (fhzp) / Additional District Secretary (Land) — 047 2256002 | ප්‍රධාන ගණකාධිකාරී / fzf;fhsu; / Chief Accountant — 047 2256246 |
| අධ්‍යක්ෂ (කෘෂිකර්ම) / gzpg;ghsu; (tptrhak;) / Director (Agriculture) — 047 3628890 | අධ්‍යක්ෂ (සංවර්ධන) / gzpg;ghsu;(jpl;lkply;) / Director (Planning) — 047 2256234 | සහකාර දිස්ත්‍රික් ලේකම් / cjtp khtl;l nrayhsu; / Assistant District Secretary — 047 2256945 | පරිපාලන නිලධාරි / epu;thf cj;jpNahfj;ju; / Administrative Officer — 047 2256285 |
| කාර්යාලය / mYtyfk; / Office | ෆැක්ස් / njhiy efy; / Fax — 047 2256235, 047 2256247 | ඊ මේල්/ kpd;dQ;ry; / email : moha.dist.hambantota@gmail.com; වෙබ් අඩවිය / ,izaj;jsk; / Web site : www.hambantota.dist.gov.lk | |

## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2025.01.29

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.01.29 වන දින පෙ.ව. 9.30ට හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

දිස්ත්‍රික් ලේකම්තුමන් විසින් රැස්වීමට සහභාගි වූ ගරු සභාපතිතුමන් ප්‍රමුඛ දේශපාලන නායකත්වයෙන් හා අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් පිළිගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමන් වෙත රැස්වීමේ ඉදිරිකටයුතු කරගෙන යාම සඳහා අවස්ථාව ලබා දෙන ලදි.

පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් අනතුරුව අඩුපාඩු කිසිවක් නොවූ බැවින් එම වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කරන ලද අතර අනතුරුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| * | පසුගිය වාර්තාවෙන් පැන නැගුණු ගැටළු | | | |
| * | කාර්මික සංවර්ධන මණ්ඩලයට ඉඩමක් පවරාදීම සම්බන්ධව (වීරකැටිය අග්‍රහැර පැරණි ගුවන් විදුලි සංස්ථාව පිහිටුවා තිබූ අක්කර 9 කින් අක්කර 20 පමණ බිම් කොටස) | කාර්මික සංවර්ධන මණ්ඩලයට ඉඩම් පවරාදීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පරිසර අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය යන ආයතන වල නිර්දේශය අවශ්‍ය බව සභාවට දැනුම් දුන් අතර එම කටයුතු අවසන් වේ නම් ඉඩම පැවරිය හැකි බවට කරුණු ඉදිරිපත් විය. | මෙම රැස්වීමේ දින සිට දින 30ක් ඇතුලත නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරන ලෙස කාර්මික සංවර්ධන අධිකාරියට උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් වීරකැටිය<br>සහකාර අධ්‍යක්ෂ කාර්මික සංවර්ධන මණ්ඩලය<br>නි.අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br>ස.අධ්‍යක්ෂ - පරිසර අධිකාරිය<br>ස.අධ්‍යක්ෂ<br>පුරාවිද්‍යාදෙපාර්තමේන්තුව |
| * | ගොඩවැලි කැණීම් බලපත්‍ර ලබාදීම | අනවසර වැලි කැණීම් සියල්ල නතර කර ඇතිබවත් වැලි ප්‍රවාහනය සඳහා පමණක් බලපත්‍ර ලබා දී ඇති බවත් ප්‍රකාශ විය. | නිසි අධීක්ෂණයකින් යුක්තව කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | කැනීම් ඉංජිනේරු භූවිද්‍යා හා පතල් කාර්යාංශය<br>ස.අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය |
| * | වන අලි ගම් වැදීම සම්බන්ධව ගැටළු | රක්ෂිත භූමිය තුල තවදුරටත් අනවසරයෙන් වගාබිම් පවත්වාගෙන යනු ලබන පුද්ගලයන් විසින් අනවසර විදුලි වැටවල් ඉදිකිරීම් කර තිබෙන බැවින් එම රක්ෂිත භූමිය පිටත පවතින ලඳුකැලෑ ඉඩම් වල වන අලීන් ගැවසෙන බවට කරුණු ඉදිරිපත් විය. එමෙන්ම එම වන අලි ගැවසෙන කලාපය සෝලා පද්ධති ස්ථාපනය කිරීම සඳහා ආයෝජකයින් විසින් එලිපෙහෙලි කිරීම නිසා එම වන අලීන් ගම්වලට පැමිණීම නිසා සාමාන්‍ය ජන ජීවිතයට බාධා එල්ලවන බවට තොරතුරු ඉදිරිපත් විය. එහෙත් අලි කලමනාකරණ රක්ෂිතය වෙන් කිරීමේ දී සෝලා පද්ධතිය ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති බිම් ප්‍රදේශය ඉවත් කර ඇති බවත් එම බිම් ආයෝජකයින්ට ලබාදී ඇති | අලි මිනිස් ගැටුම අවම කිරීම රටේ සංවර්ධනය සඳහා විදුලිය අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින් සෝලා පද්ධති ඉදිකිරීම් සම්බන්ධව සහ අනවසර වගා කරුවන් ඉවත් කිරීම සම්බන්ධව සියලුම පාර්ශව කැඳවා සාකච්ඡා කර ඉදිරි කටයුතු කරන ලෙසටත් රක්ෂිත භූමිය තුල අනවසරයෙන් වගා කරනු ලබන ඉතිරි වගාකරුවන් සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් එම රැස්වීමේ දී ලබාදෙන ලෙසත් තීරණය | අතිරේක දිස්ත්‍රික් ලේකම් ඉඩම්<br>නේවාසික ව්‍යාපෘති කළමනාකරු මහවැලි<br>සහකාර අධ්‍යක්ෂ වනජීවී<br>සහකාර අධ්‍යක්ෂ මධ්‍යම පරිසර අධිකාරිය<br>අදාළ ප්‍රාදේශීය ලේකම්වරු |



බිඟුල් ඉන්දුවීන් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | බවත් එබැවින් එම ආයෝජකයින් ඉදිකිරීම කටයුතු සිදුකරමින් පවතින බවටත් ඒවා නීතිවිරෝධි නොවන බවටත් කරුණු ඉදිරිපත් විය. | විය. | |
| | **2025.01.29 දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කල කරුණු** | | | |
| 01 | 2025 වර්ෂයේ දකුණු පළාත් සභාව මගින් දිස්ත්‍රික්කය වෙනුවෙන් ලබා දී ඇති ප්‍රතිපාදන සම්බන්ධයෙන් දැනුවත් කිරීම | දකුණු පළාතේ සංවර්ධන කටයුතු වෙනුවෙන් නිශ්චිත ප්‍රදාන හා උපමාන පාදක ඇතුළුව රුපියල් මිලියන 6250.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇති අතර (හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය මගින් රු.මි. 444.5ක්ද, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් රු.මි. 327.1ක්ද, කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් 327.31ක්ද, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ රු.මි. 106.26 ක්ද, ධීවර හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශය යටතේ 201.54 ද වශයෙන් මුළු ප්‍රතිපාදන රු.මි. 1406.77 ක ප්‍රතිපාදන ලැබී ඇති බවට කරුණු දක්වන ලදී.<br>වර්ෂය ආරම්භයේදී සැලැස්මෙන් වෙන් කරනු ලබන්නේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන පමණක් බවත් අවශ්‍යතාවය අනුව නම්‍යශීලි සහ විශේෂ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කළ හැකි බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂ සඳහා වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇති බැවින් එම සියළුම ප්‍රතිපාදන යටතේ හඳුනාගෙන ඇති ව්‍යාපෘති කඩිනමින් ආරම්භ කරන ලෙසට උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව<br><br>දකුණු පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) දකුණු පළාත |
| 02 | කටුවන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ 2025.01.29 දින කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද වැඩසටහනක් සම්බන්ධව. | කටුවන ප්‍රදේශයේ ගම්මානයක් තෝරා ගනිමින් ක්‍රියාත්මක වන කෘෂිකර්ම වැඩසටහන සම්බන්ධව පූර්ව දැනුවත් වීමක් සිදු කර නොමැති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. එහිදී පළාත් සභා වැඩසටහන්වලට ලබා දී ඇති යෝජනාවක් පරිදි අද දින කෘෂිකර්ම නිලධාරීන් කටුවන ප්‍රදේශයේ කෘෂි ගම්මාන වැඩසටහන සඳහා දැනුවත් කරමින් ඒ සඳහා ගොවිමහතුන් ගෙන් අවශ්‍යතා පිළිබඳ යෝජනා ලබා ගැනීම සඳහා PRA වැඩසටහනක් ක්‍රියාත්මක කරන බවට කරුණු ඉදිරිපත් කරන ලදී | කටුවන ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කෘෂිගම්මාන වැඩසටහන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙසත් ,සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති යෝජනා සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුදැනුවත් කර අවශ්‍ය අනුමැතිය යටතේ ක්‍රියාත්මක කලයුතු බවටත් උපදෙස් දෙන ලදී. | අධ්‍යක්ෂ (කෘෂිකර්ම)<br><br>සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br><br>අදාළ අනෙකුත් ආයතන ප්‍රධානීන් |
| 03 | සූරියවැව මීගහජඳුර නා සෙවන පොල් ඉඩම සම්බන්ධව | මෙම ඉඩම සම්බන්ධව සියලු විස්තර ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස දැනුවත් කර ඇතත් එම වාර්තාව මේ වන විටත් ලැබී නොමැති බව දන්වන ලදී.<br>මෙම ඉඩම අක්කර 80 කට ආසන්න රජය සතු ඉඩමක් වන අතර සූරියවැව ප්‍රාදේශීය ලේකම් වෙත නීත්‍යානුකූලව පවරා නොමැති බවත්,හමුදා නිලධාරීන් යොදවා ඉඩමේ සංවර්ධන කටයුතු සිදු කරන බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. | සති දෙකක් ඇතුළත සියලු විස්තර ඇතුළත් වාර්තාවක් ලබා දෙන ලෙස තීරණය කරන ලදී. | ප්‍රාදේශීය ලේකම් සූරියවැව |

විමල් ඉන්දුජිත් ද සිල්...
දිස්ත්‍රික් ලේකම් / දිසාප...

| | | | | |
|---|---|---|---|---|
| | වීරකැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බැදිගම වසමේ පිහිටි පොල් ඉඩම සම්බන්ධව | මෙම ඉඩමද ආරක්ෂක නිලධාරීන් යොදවා සංවර්ධන කටයුතු ඉටු කරවා ගන්නා බවත්, මෙම ඉඩම්වලින් උපයන ආදායම් සම්බන්ධ ගැටලුවක් පවතින බවටත් කරුනු ඉදිරිපත් විය. | ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයට (LRC) අයත් ඉඩමක් බැවින් සියලු විස්තර ඇතළත් වාර්තාවක් ලබා දෙන ලෙස තීරණය කරන ලදී. | අධ්‍යක්ෂ ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය |
| 04 | Clean Sri Lanka වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීම | අතිගරු ජනාධිපතිතුමන්ගේ 2025 ජනවාරි 01 දින එළිදැක්වූ Clean Sri Lanka වැඩසටහනට සමගාමීව හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් කි.මී.151 ක් වන වෙරළකළාපය පිරිසිදු කිරීමේ වැඩසටහනක් 2025.02.08 දින සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විටත් සූදානම් කර ඇති බවත් , ඒ අනුව තිස්සමහාරාම කිරින්ද සිට බූන්දල දක්වාත් , පට්ටිය වරාය සිට කලමැටිය දක්වාත්, ගුරුපොකුණ සිට තංගල්ල වරාය දක්වාත්, තංගල්ල වරාය සිට කුඩා වැල්ල වරාය දක්වාත් කලාප 05 ක් යටතේ වෙන් කර ගනිමින් වෙරළ ආශ්‍රිත පරිසරය පිරිසිදු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br>ප්‍රජාව, ආරක්ෂක අංශ, මෙන්ම සියලුම ආයතන වලින් උපරිම ශ්‍රම දායකත්වයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී, | මෙම ආරම්භක වැඩසටහන සාර්ථකව කර ගැනීම සඳහා සියලු දෙනාටම ඒ සඳහා සම්බන්ධවන ලෙස දන්වන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සියළුම ප්‍රදේශීය ලේකම්වරු<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ආයතන ප්‍රධානීන් |
| 05 | වී මිලදී ගැනීමේ වැඩසටහන සම්බන්ධව දැනුවත් කිරීම | 2024/2025 මහකන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ මධ්‍යස්ථාන 11 ක ගබඩා 18 ක් දැනටමත් සූදානම් කරමින් සිටිනබවත් , ගබඩා ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විට 80%කින් පමණ අවසන් කර ඇති බවත්, රජයේ වී මිලදී ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වී අළෙවි මණ්ඩලය සූදානම් බවත්ප්‍රකාශ කරන ලදී.<br>පල්ලෙමළල ගබඩාවේ අලුත්වැඩියා කටයුතු අවසන් අදියරේ තිබෙන බවත් , බූන්දල පාර්ක් එකේ සිට වන අලින් ගමට ඒමේදී ගබඩාව හරහා ගමන් කිරීම නිසා දින දෙකකට පෙර නැවත ගේට්ටුව කඩා දමා ඇති බවත් මෙම ගැටලුව සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | සියලු පාර්ෂව එක්වී ගබඩා ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කල ලෙසින්ම, වී මිලදී ගැනීමෙන් පසු ගබඩාවල ආරක්ෂාව කෙරේ විශේෂ අවධානයක් යොමු කල යුතු බවට උපදෙස් දෙන ලදී, | ප්‍රාදේශිය කළමනාකරු වී අළෙවි මණ්ඩලය<br><br>අධ්‍යක්ෂ කෘෂිකර්ම |
| 06<br>i | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන සෞඛ්‍ය වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම | මාතෘ හා ළමා සෞඛ්‍ය එන්නත් සායනවලට අමතරව මව්වරුන් දැනුවත් කිරීම සඳහා විශේෂිත වැඩසටහන් 03ක් වන මව්කිරි කළමනාකරණ වැඩසටහන, අතිරේක ආහාර වැඩසටහන, පූර්ව ළමාවිය වැඩසටහන හම්බන්තොට දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක වන බවත්, බෝනොවන රෝග ඒකකය මගින් අවුරුදු 35 ට වැඩි ජනතාව වෙනුවෙන් සායන පවත්වන බවත් මේ වන විට | MOH සම්බන්ධ කර ගනිමින් දිස්ත්‍රික්කය තුළ තැලසීමියා රෝගීන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර වාර්තාවක් ලබා දෙන ලෙසත් , සියදිවි නසා ගන්නා පවුල් සම්බන්ධව අධ්‍යයනයක් කරන ලෙසත් ප්‍රතිපාදන අවශ්‍ය වේ නම් පළාත් සභාව | ලේකම් ප්‍රධාන අමාත්‍යංශය දකුණු පළාත<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |



ටිමල් ඉන්දුවින් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති

| | | | | |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික්කය තුළ දියවැඩියාව රෝගීන් 14%, අධිරුධිර පීඩන රෝගීන් 18% ක් පමණ සිටින බවත් දිස්ත්‍රික්කය තුල සුවදිවි සායන 25ක් ක්‍රියාත්මක කරන බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. මී උණ සහ ඩෙංගු මර්දන වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා ග්‍රාමීය ඩෙංගු කමිටු සක්‍රීය වීම අවශ්‍ය බවත්, එම රැස්වීම් වාර්තා MOH කාර්යාලවලට ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. තවද දිස්ත්‍රික්කය තුළ සුනඛ ගහනය ඉහළ යාම නිසා අනතුරු සිදුවීම සහ සපාකෑම් ඉහළ ගොස් ඇති බවටත් කරුණු ඉදිරිපත් විය. එසේම පාසල් දරුවන් ඉලක්ක කර ගනිමින් තැලසීමියා රෝගය හඳුනාගැනීමේ පරීක්ෂණ ඉදිරියේදී කිරීමට සැලසුම් කර ඇති බවද මේ සඳහා සියලුම පාසල්වල 10 ශ්‍රේණියේ සිසුන්ගේ රුධිර පරීක්ෂණ කිරීමට සැලසුම් කර ඇති බවත් දන්වන ලදී. දිස්ත්‍රික්කයේ රෝහල්වල සහ සෞඛ්‍ය මධ්‍යස්ථානවල වැසිකිළි නොමැති වීම සහ තිබෙන වැසිකිළි ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකල යුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | මගින් ප්‍රතිපාදන ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. | |
| ii | තංගල්ල බාලිකාව සහ රෝහල අතර තිබෙන පටු බිම් තීරුව වෛද්‍යවරුන්ගේ රථ වාහන නතර කිරීම සඳහා ලබා දෙන ලෙස ඉල්ලීම් කිරීම | මෙම බිම්තීරයේ රෝහලට පැමිණෙන මහජනතාවගේ පාපැදි සහ යතුරුපැදි නතර කරන බවත් , වෛද්‍යවරුන් ගේ වාහන නතර කිරීම සඳහා තැපැල් කන්තෝරුව ආසන්නයේ ඉඩකඩ සලසා ඇති බවට කරුණු ඉදිරිපත් විය. රෝහල ආසන්නයේ ඇති පටු බිම් තීරුව වෛ ද්‍යවරුන්ගේ වාහන නැවැත්වීම සඳහාත්, තැපල් කන්තොරුව ආසන්න භූමිය පාපැදි සහ යතුරුපැදි නතර කිරීමටත්,නගර සභාවෙන් එකඟතාවය ලබාදෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | වෛද්‍යවරුන්ගේ වාහන නතර කිරීම සඳහා මෙම බිම් කොටස නිදහස් කිරීමට හැකියාවක් පවතින්නේද යන්න පිළිබඳ සොයා බලා ගැටලුවක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් දැනුම් දෙන ලෙස උපදෙස් දෙන ලදී. | වෛද්‍ය අධිකාරී තංගල්ල මූලික රෝහල<br><br>නගර සභාව තංගල්ල |
| iii | තංගල්ල මූලික රෝහල සඳහා අක්ෂි විශේෂඥ වෛ ද්‍යවරයකු ලබා ගැනීම සම්බන්ධව | තංගල්ල ප්‍රදේශයේ අක්ෂි රෝගීන් විශාල ප්‍රමාණයක් සිටින බවත්, ඒ සඳහා අවශ්‍ය සැත්කම් කිරීම සඳහා විශේෂඥ අක්ෂි වෛද්‍යවරයකු රෝහලේ නොමැති බැවින් රෝගීන් දැඩි ලෙස අපහසුතාවයකට පත්ව සිටින බවත්, මෙම රෝහල සඳහා ස්ථිර අක්ෂි විශේෂඥ වෛද්‍යවරයකු ලබා දෙන ලෙස අදහස් දක්වන ලදී. | තංගල්ල රෝහල සඳහා ස්ථිර අක්ෂි වෛද්‍යවරයකු ලබා දෙන ලෙස ලිඛිතව අදාළ ආයතන දැනුවත් කරන ලෙසත්, ඒ සඳහා යම් බාධාවක් ඇත්නම් දැනුවත් කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| 07 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් දැනුවත් කිරීම | දකුණු පළාත තුළ නීතිය හා සාමය සුරැකීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඒ හා සමගාමීව මෙම දිස්ත්‍රික්කය තුළ ද සංවිධානාත්මක අපරාධ,අනිකුත් අපරාධ, මත්පැන් හා මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන් තුරන් කිරීම , රථවාහන පාලනය හා අනෙකුත් පොලිස් රාජකාරි විධිමත්ව ඉටු කිරීමට බලාපොරොත්තු වන බවත්, විශේෂයෙන්ම සංවිධානාත්මක අපරාධ වැලැක්වීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් | නීතිය හා සාමය ආරක්ෂා කිරීම සඳහා පොලිසිය වෙත සෑම අවස්ථාවකම සහයෝගය ලබා දීමට කටයුතු කරන ලෙසත් , ප්‍රජා පොලිස් කමිටු සක්‍රීය කිරීමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසා...
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | මේ වන විටත් ක්‍රියාත්මක වන බවත්,ඉදිරියේදී මෙම ක්‍රියාවන් සම්පූර්ණයෙන් නතර කිරීම සඳහා ස්ථිර වැඩ පිළිවෙළක් සකස් කරන බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී. මත්ද්‍රව්‍ය පාලනය කිරීමේ වැඩසටහන් තුළින්ද සැපයුම් පාලනය කලද, ඒ සඳහා ඇති ඉල්ලුම් පාලනය කිරීම සඳහා රාජ්‍ය ආයතනවල සහයෝගය අවශ්‍ය බව දන්වන ලදී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ රාජ්‍ය ආයතන නොමැති බැවින් කන්දකාඩු මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට සිදු වන බැවින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලෙස ඉල්ලීම් කරන ලදී.<br>අම්බලන්තොට ප්‍රදේශයේ අනවසර වැලි ජාවාරම් නතර කර ඇති බවත් වැටලීම් කණ්ඩායම් 02 ක් දිනපතා දිවාරාත්‍රී යොවා ඇති බවත් දන්වන ලදී.එසේම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී රාජකාරියේ යෙදෙන පොලිස් නිලධාරීන් ජාවාරම් කරුවන් සමග සම්බන්ධවී ක්‍රියා කරන්නේ නම් එම නිලධාරී වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව අවධාරණය කරමින් පසු ගිය මාසයට අදාළව පොලිසිය විසින් අපරාධ වැලැක්වීම සම්බන්ධව සිදු කර ඇති ක්‍රියා මාර්ගවලට අදාළව වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. | | දිස්ත්‍රික්කයේ සියළුම ආයතන ප්‍රධානීන්<br><br>නියෝජ්‍ය මෝටර්රථ ප්‍රවාහන කොමසාරිස් |
| 08 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| I | **තිස්සමහාරාම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| i | තිස්සමහාරාමය ප්‍රාදේශීය සභාවට අයත් කානු පද්ධති පිරිසිදු කිරීම් සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලු | මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කානු පද්ධතියේ නඩත්තු කටයුතු ප්‍රාදේශීය සභාවෙන් සිදු කරන බවත්, ඉදිකිරීම්වල තාක්ෂණික ගැටලු පවතින බැවින් විධිමත් පරිදි කානු පද්ධතිය හරහා ජලය බැස නොයෑම හේතුවෙන් පිරිසිදු කිරීම් කටයුතු කිරීම අපහසුව ඇති බවත් , ප්‍රාදේශීය සභාවට සේවක පුරප්පාඩු පවතින බවටත් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>2025 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රතිපාදන ලැබීමෙන් පසු මේවා නිවැරදි කරන බවදැනුම් දෙන ලදී. | විධිමත් තාක්ෂණය උපයෝගී කර ගනිමින් කානු පද්ධතිය සකස් කිරීම සඳහා සැලසුම් සකස්කලයුතු බවත්, ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් අදාළ ආයතන ලිඛිතව දැනුම් දෙන ලෙසත් උපදෙස් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් ක තිස්සමහාරාම<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව තිස්සමහාරාම |
| ii | රන්දුනුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇති 122 පාබල බලසේනා මූලස්ථානයේ විදුලි | බල සේවා මූලස්ථානයට යන ප්‍රධාන මාර්ගය සඳහා විදුලි පහන් සවිකර දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. අලුතින් කණු සිටුවීමට නොහැකි බවත් තිබෙන කනු සඳහා විදුලි පහන් සවිකර දීමට ප්‍රාදේශීය සභාව ප්‍රාදේශීය | මෙවැනි ගැටලු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී විසදා ගැනීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන | ලේකම් ප්‍රාදේශීය සභාව තිස්සමහාරාම |



ඩබ්ලිව්. ඉන්ද්‍රවංශ ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | පහන් කනු නොමැතිවීම සම්බන්ධව. | සම්බන්ධීකරණ කමිටුවේදී එකඟ වූ බවට කරුණු ඉදිරිපත් කරන ලදී. | ලදී. | |
| iii | සුදුසුකම් ලත් ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් ප්‍රමාණවත් නොවීම. | හම්බන්තොට කලාපයේ පළාත් සභා පාසල් 115ක් තිබෙන බවත් ඉන් පාසල් 50 ක ශ්‍රේණිධාරී නොවන විදුහල්පතිවරුන් සිටින බවත්, ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් නොමැති බැවින් ගුරු සේවයේ නිලධාරීන්ගෙන් රාජකාරි ආවරණය කරන බවටත්, පාසල් ළමුන් 1000කට වඩා වැඩි පාසල් සඳහා ශ්‍රේණිධාරී ගුරුවරු අවමය 3ක් සිටිය යුතුබවත් කුඩා පාසල් භාර ගැනීම සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් ඉදිරිපත් නොවන බවටත් කරුණු ඉදිරිපත් විය.<br>සියලුම ශ්‍රේණිධාරී විදුහල්පතිවරු පළාත් පාසල් සඳහා පත් කර ඉතිරිවන පාසල් සඳහා ශ්‍රේණිධාරී නොවන ගුරුවරු නියෝජ්‍ය විදුහල්පතිවරුන් ලෙස පාසල් වෙත යොමු කිරීම ද සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | ශ්‍රේණිධාරී ගුරුවරුන්ගෙන් විදුහල්පති පුරප්පාඩු සම්පූර්ණ කරගන්නා ලෙසත් ඉතිරිවන ශ්‍රේණිධාරී ගුරුවරුන් නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරුන් ලෙස පත් කරගන්නා ලෙසත් ඒ සඳහා ශ්‍රේණිධාරී ගුරුවරුන්ගේ හිගයක් වේ නම් ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් නියෝජ්‍ය/සහකාර විදුහල්පතිවරු ලෙස පත්කර ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - තංගල්ල/වලස්මුල්ල/ හම්බන්තොට. |
| II | **සූරියවැව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| i | මදුනාගල උණුදිය උල්පත් ආශ්‍රිතව ඇති කෘෂිවාරි ඉඩම් සම්බන්ධ ගැටලු | කුඹුරු අක්කර 9ක් පුද්ගලයින් 8 දෙනෙකු වෙත බදු පදනම් යටතේ වී වගාවට ලබා දී ඇති බවත් , අවුරුදු 15ක් තිස්සේ රු.5000.00 බැගින් බදු ගෙවා ඇති බවත්, පසුව වී කිලෝවකට රු.85 .00 බැගින් තක්සේරු කිරීමේදී රු4.0,000.00මුදලක් දක්වා බදු මුදල වැඩිවී ඇති බවත්, බදුකරුවන් 8 දෙනා අතරින් තිදෙනෙකු බදු නොගෙවන බවත්, රුහුණු සංචාරක කාර්යාංශය මගින් විධිමත් පරිදි තක්සේරුව සිදු කර ඇති බවට වාර්තාවක්ද ලබා දී ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එමෙන්ම සංචාරක බංගලාවට අයත් ඉඩම සම්බන්ධයෙන්ද කරුණු ඉදිරිපත් කරන ලද අතර එය පළාත් සභාවේ මැදිහත් වීමෙන් විසඳුම් ලබා දීමට එකඟ විය. | බදුකරුවන් 8 දෙනා අතුරින් 5 දෙනෙකු බදු ගෙවා තිබේ නම් ඉතිරි අය ගෙන්ද බදු අයවිය යුතු බවට උපදෙස් දෙන ලදී. | සභාපති රුහුණු සංචාරක කාර්යාංශය<br><br>ප්‍රාදේශීය ලේකම් - සූරියවැව |
| ii | සූරියවැව හබරත්තවල මාර්ගයේ කොටසකට විදුලිය නොමැති වීම | මෙම ප්‍රදේශය අම්බලන්තොට විදුලි බල ප්‍රදේශයට සහ සූරියවැව බල ප්‍රදේශය අතර ප්‍රධාන මාර්ගයේ පවතින කි.මී 1ක පමණ ප්‍රදේශය සඳහා විදුලිය නොමැති බවට කරුණු ඉදිරිපත් කරන ලදී.<br>එම ප්‍රදේශයට විදුලිය ලබා දීම සඳහා ගම්වාසීන් විසින් ඉල්ලීමක් කල යුතු බවත්, එසේ ඉල්ලීම් ඉදිරිපත් කර නොමැති බව දන්වන ලදී . | ප්‍රධාන මාර්ගයේ විදුලිය ලබා දීමට ප්‍රජාවගේ ඉල්ලීම් අවශ්‍ය නොවන බවත්, මෙම මාර්ග කොටසට විදුලිය සපයන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රධාන විදුලි ඉංජිනේරු හම්බන්තොට |
| iii | උසස් පෙළ සිසුන්ට ලබාදීමට යෝජනා වූ | 2015/16 වර්ෂ වල උසස් පෙළ සිසුන් වෙනුවෙන් ටැබ් පරිගණක ලබා දීම | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් | දිස්ත්‍රික් ලේකම් |



නිලේ ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසා
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | ටැබ් වර්ගයේ පරිගණක යන්ත්‍ර | වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය ටැබ් යන්ත්‍ර ලබාගෙන ඇති බවත් ඒවා පාසල් දරුවන්ට ලබාදී නොමැති බවත් දන්වන ලදී. | වාර්තාවක් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | |
| iv | සූරියවැව කොට්ඨාශයේ පාසල් වල පවතින සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ගැටලු | ඇතැම් පාසල් වල සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි සිදු නොවන බවත් එම කටයුතු සඳහා රජය මඟින් ප්‍රතිපාදන ලබා ගැනීමේ හැකියාවක් පවතීදැයි කරුණු ඉදිරිපත් විය. පාසල් වල යටිතල පහසුකම් සඳහා (ප්‍රාග්ධන ස්වරූපයේ) වියදම් දැරීමට ප්‍රතිපාදන වෙන් කලත් සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් වියදම් සඳහා රජය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුනොවන බවත් පාසල් වල පහසුකම් හා සේවා ගාස්තු සඳහා මුදල් අය කර ගැනීමේ බාධාවක් නොවන බැවින් එම අරමුදල් යොදවා මෙවැනි කටයුතු සිදුකරගන්නා ලෙසත්, එමෙන්ම වැසිකිළි ආරක්ෂිත සහිතව භාවිතා කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව දරුවන්ට අධ්‍යාපනය ලබාදීම අත්‍යවශ්‍ය බවට කරුණු ඉදිරිපත් වූ අතර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් දැනටමත් පාසල් සඳහා අනියම් සේවකයින් 4000කට ආසන්න ප්‍රමාණයක් ලබා දී ඇති බවත් දන්වන ලදී. | වැසිකිළි භාවිතය සම්බන්ධව දරුවන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් පාසල් වලට ඇතුලත් කර ඇති අනියම් සේවකයින් මඟින් අදාල කාර්යයන් ඉටු කරවා ගැනීමට කටයුතු කලයුතු බවට උපදෙස් දෙන ලදී. | ලේකම් දකුණුපළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තංගල්ල/හම්බන්තොට/වලස්මුල්ල |
| III | **හම්බන්තොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| i | පශු වෛද්‍ය කාර්යාලය සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ලබා ගැනීම සම්බන්ධව | පශු වෛද්‍ය කාර්යාලය සඳහා ස්ථිර ස්ථානයක් නොමැති බවත් , බිම් කුලිය සඳහා රු. 40,00.00ක මාසික උපරිම මුදලක් ගෙවීමට පමණක් හැකි බවත්, පරිපාලන සංකීර්ණයේ ස්ථානයක් ලබා ගැනීමට අවශ්‍ය බිම් කුලිය වැඩි බැවින් පරිපාලන සංකීර්ණය ආසන්නයෙන් ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | රු.35,000.00 කළු ආසන්න මාසික බදු පදනම යටතේ නගර සභාවට අයත් පුස්තකාල ගොඩනැගිල්ලේ ස්ථානයක් ලබා දිය හැකි බවත්, එසේ නොමැතිව පරිපාලන සංකීර්ණයේ ස්ථානයක් ලබා ගන්නේ නම් අමාත්‍යංශය හරහා ඉල්ලීම් කරන ලෙසත් ඒ සඳහා පළාත් සභාවෙන් ප්‍රතිපාදන ලබා දිය හැකි බවත් දැනුම් දෙන ලදී. | නාගරික කොමසාරිස් හම්බන්තොට<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| ii | ගොන්නෝරුව ඇහැටුගල ඉඩමේ මහානාම ලොකුආරච්චිගේ රජිව් ක්‍රිශාන්ත මයා විසින් පවත්වා ගෙන යනු ලබන කලුගල් ව්‍යාපෘතිය | අලි කළමනාකරණ රක්ෂිතය තුල දැනට පවත්වාගෙන යන මෙම ව්‍යාපෘතිය සඳහා නිර්දේශ ලබාදෙන ලෙස ඉල්ලීම් කරන ලදී. | වන අලි ගම් වැදීම සම්බන්ධව පවත්වනු ලබන කමිටුවේදි මේ සම්බන්ධව තීරණය කරගත යුතු බවට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාප
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| IV | **වීරකැටිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව මගින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| i | මණ්ඩාඩුව ජල කුළුණ සහිත ඉඩමට ප්‍රවේශ වීම සඳහා මාර්ගය වෙනස් කිරීම | මණ්ඩාඩුව ජල කුළුණ තිබෙන ස්ථානයට ප්‍රවේශ වීම සඳහා නිශ්චිත මාර්ගයක් සිතියම්ගත කිරීමට වීරකැටිය ප්‍රාදේශීය සභා ක්‍රීඩාංගනයෙන් හෝ වාරි මාර්ග දෙපාර්තමේන්තුවෙන් අවසර නොලැබීම මත ජල සම්පාදන මණ්ඩලයට අයත් භූමිය මේ දක්වා වෙන් කර ගැනීමට හැකියාවක් ලැබී නොමැති බව ප්‍රකාශ විය. ප්‍රාදේශීය සභාව සතු භූමිය මේ සඳහා වෙන් කිරීමෙන් හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. දැනටමත් ජල කුළුණ දක්වා ප්‍රවේශ වන වාරිමාර්ග කාර්යාලයේ මාර්ගය භාවිතයට කිසිඳු බාධාවක් නොමැති බවත් එම ජල කුළුණ අයත් බිම් කොටසට මාර්ගය ඉල්ලුම් කරන්නේ වීරකැටිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ප්‍රධාන පිවිසුමෙන් නිසා වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ යන්ත්‍ර පර්යන්ත්‍රයට විශාල රථ වාහන රැගෙන ඒමට මෙම මාර්ගය භාවිතා කරන බැවින් එම මාර්ග කොටස ජලසම්පාදන මණ්ඩලයට අයත් භූමියක් ලෙස සිතියම්ගත කර වෙන් කිරීමට ඉඩදිය නොහැකි බවටත් කරුණු වාර්තා විය. | මෙම ආයතන දෙකට පමණක් පොදු මාර්ගයක් ලෙස භාවිතය සඳහා අදාළ කොටස සිතියම්ගතකොට ඉදිරි කටයුතු සිදුකරන ලෙස දැනුවත් කරන ලදී. | අධ්‍යක්ෂ වාරිමාර්ග<br><br>ප්‍රාදේශීය කළමනාකරු ජලසම්පාදන මණ්ඩලය<br><br>ජේ.මිනින්දෝරු අධිකාරි |
| 09 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ගරු සභාපතිතුමන්ලා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා** | | | |
| i | රන්න නගරයට පොදු ක්‍රීඩාංගනයක් ලබා ගැනීම සම්බන්ධව | රන්න නගරයට ක්‍රීඩා පිටියක් නොමැති බැවින් දැනට රෝහල පවත්නා භූමිය මේ සඳහා සුදුසු බවත් රෝහල සඳහා වීරකැටිය පාරේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතු භූමිය සහ එයට යාබද ප්‍රාදේශීය සභා භූමිය සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. එහෙත් නගර සැලැස්මට අනුව රන්න පාසලට පිටුපසින් අක්කර 2ක පමන ඉඩමක් ක්‍රීඩාපිටිය සඳහා යෝජනා වී එම ඉඩම අත්පත් කර ගැනීම සම්බන්ධව පියවර කිහිපයක් අනුගමනය කර අවසන්ව නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව අදාල පාර්ශ්ව සම්බන්ධ කර ගනිමින් ස්ථානීය පරික්ෂාව සිදුකර වෙනම ම සාකච්ඡාවක් කර වඩාත් සුදුසු ස්ථානය තෝරා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>ප්‍රාදේශීය ලේකම් - තංගල්ල<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>ප්‍රාදේශීය සභාව - තංගල්ල |
| ii | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියන්ගේ පවතින උග්‍රහිඟතාවය හේතුවෙන් සේවා පවත්වාගෙන යාමේ අපහසුතා | හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් සෞඛ්‍ය නිලධාරීන් 46 දෙනෙකුගේ හිඟතාවය සහ කොන්ත්‍රාත් පදනම මත 23 ක් සේවයේ යෙදීමත් සහ විශ්‍රාමයාම සඳහා ඉල්ලුම් කිරීමත් හේතුවෙන් මෙම තත්වය ඇති වී තිබේ. එමෙන්ම බඳවා ගැනීමේ පටිපාටිය මත පුහුණු අවුරුදු 03 සමඟ දීර්ඝ කාලයක් ගත වන බවත් මෙම ගැටළුව සෞඛ්‍ය අංශයේ පවතින බවටත් කරුනු ඉදිරිපත් විය. | මෙම ගැටළුව සෞඛ්‍ය අමාත්‍යාංශයට යොමු කිරීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම්<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| iii | ගැමුණු ගොවි සංවිධානයට අයත් කුඩා වැව් යටතේ ඇති ප්‍රධාන ඇලවේලි දෙකක් කොන්ක්‍රීට් අතුරා සකස් කිරීමේදී සිදුවූ අක්‍රමිකතා සහ රුපියල් 4,975,000.00ක මුදලක් අවභාවිතා කිරීම සම්බන්දව. | අදාළ ඉදිකිරීම් ස්ථානීය පරීක්ෂණයක් අනුව සකස් කරන ලද ඇස්තමේන්තුවක් අනුව සිදුකල බවත් එම ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් බවත් කිසිදු අක්‍රමිකතාවයක් සිදු නොවූ බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙයට අදාළ කටයුතු ගොවිජනසේවා කොමසාරිස් යටතේ සිදුවන බැවින් ඊට අදාළ ඉදිරි කටයුතු කරගෙන යාමට පියවර ගන්නා ලෙස උපදෙස් ලැබීම. ගොවි සංවිධානයට අදාළව එක් සාමාජිකයෙක් පමණක් කැඳවීම. | ගොවිජන සේවා සහකාර කොමසාරිස් |
| Iv | ප්‍රධාන පිවිසුම් මාර්ගයහි නම වෙනස් කිරීම සම්බන්ධව | ෂැන්ග්‍රිලා හෝටලය විසින් ෂැන්ග්‍රිලා මාවත ලෙස නම්කොට එම මාවතේ නඩත්තු කටයුතු ඔවුන් විසින් ම කරගෙන යාමට ඉල්ලා සිටින අතර මේ සඳහා ප්‍රාදේශීය මන්ත්‍රීතුමන්ගේ අනුමැතිය ලබා ගැනීම. | මාර්ගයකට නමක් යෝජනා කිරීම සඳහා ඇති පිළිගත් ක්‍රමවේදයකට අනුව කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>ලේකම් ප්‍රාදේශීය සභාව හම්බන්තොට |
| 10 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති යෝජනා** | | | |
| i | හ/වැලිගත්ත මහා විද්‍යාලය හා කුඩාගම 10 ප්‍රාථමික විද්‍යාලය ඒකාබද්ධ කිරීම. | ප්‍රාදේශීය ලේකම්ගේ අධ්‍යයනය මත අනුමැතිය ලැබී තිබේ. | අනුමැතිය ලබා දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |
| ii | හ/හුංගම ජාතික පාසලේ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම | මෙය ක්‍රිකට් ක්‍රීඩා පිටිවලට අදාල ව්‍යාපෘතිය සමඟ සමගාමී වන බැවින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කලයුතුය. | ප්‍රාදේශීය සම්බන්ධීරණ කමිටුවේ සාකච්ඡා කර අනුමැතිය ලබාගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |
| 11 | **වෙනත්** | | | |
| i | **තිස්ස මාතර මාර්ගයේ මාර්ග මධ්‍ය ඉවත් කර පිවිසුමක් ලබා ගැනීම** | හම්බන්තොට දිස්ත්‍රික්කය ආශ්‍රිතව පැය 24 පුරාම විවෘතව පවතින එකම ඉන්ධන පිරවුම්හල මෙය බවත් හම්බන්තොට දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍යවරුන් ඇතුළු කාර්ය මණ්ඩලය ද මේ සම්බන්ධව ඉල්ලුම් කරන අතර තිස්ස සිට මාතර දෙසට ධාවනය වන රථවාහන ඉන්ධන ලබා ගැනීම සඳහා ඉන්ධන පිරවුම්හල පසුකර 2km කට ආසන්න දුරක් ගෙවා අධිවේගී මාර්ග පිවිසුම ද පසු කර තවත් අමතර දුරක් ගමන් කිරීමෙන් පසුව හමුවන හැරවුමෙන් නැවත හරවා ගමන් කිරීමට සිදුවීමත් අනතුරුවීමට ප්‍රමුඛතාවය වැඩිවීමත් සම්බන්ධව ද විශේෂයෙන්ම රාත්‍රී කාලයේ මෙම ප්‍රදේශයේ වන අලි ගැවසීම අධික නිසා වාහන නැවත හරවා ඒමත් වන අලීන්ගෙන් අනතුරු වීමට ඉඩ ඇති බවට ද කරුණු ඉදිරිපත් විය. මාර්ග සංවර්ධන අධිකාරි විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයන් අනුව මෙම | මහජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් විශේෂිත තත්ව යටතේ මෙම ඉල්ලීම සම්බන්ධව නැවත වරක් සලකා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දැනුම් දෙන ලදී. | ප්‍රධාන ඉංජිනේරු මාර්ග සංවර්ධන අධිකාරිය තංගල්ල. |

දිස්ත්‍රික් ලේකම් / දිසාප...
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | ඉල්ලීම ප්‍රතික්ෂේප කර තිබෙන බව දැනුම් දෙන ලදී. | | |
| ii | හම්බන්තොට මහ රෝහල පිහිටි භූමිය රෝහල වෙත මෙතෙක් පවරා නොදීම සම්බන්ධව. | හම්බන්තොට මහ රෝහල පිහිටි ඉඩම නීත්‍යානුකූලව පවරා නොදීම හේතුවෙන් රෝහල් සංවර්ධන ව්‍යාපෘති සැලැස්ම සඳහා ගැටළුකාරී තත්වයක් මතු වී ඇති බවත් ඒ වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් රෝහල ඉදිකිරීම් කටයුතු කල ද එම ඉඩම නීත්‍යානුකූලව රෝහලට පවරා දීම සඳහා මහවැලි අධිකාරියට පවරා දී විධිමත් ලෙස පැවරීමේ මූලික කටයුතු සඳහා අනුමැතියට යොමු කර ඇති බව දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු තීරණයක් ලෙස එම ලිපිය පැවරීම කඩිනම් කරන ලෙස උපදෙස් ලබාදීම. | අධ්‍යක්ෂ මහරෝහල හම්බන්තොට<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු මහවැලි අධිකාරිය<br><br>නි.අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය |
| iii | පරිපාලන සංකීර්ණය අසල සිට ගුවන් පාලම පසුකොට Blackstone හෝටලය දක්වා මාර්ගයේ විදුලි පහන් නොමැති වීම. | මාර්ගයේ සවිකර තිබූ වයර් කොටස් ඉවත් කිරීම නිසා දැනට මෙම ප්‍රදේශය අඳුරේ පවතින බවත් නිරන්තරව වන අලින් ගැවසීම හේතුවෙන් ජීවිත හා රථ වාහන වලට හානි විය හැකි බැවින් මෙය පිළිසකර කර ගැනීම අත්‍යාවශ්‍ය බවත් දන්වන ලදී. එහෙත් වයර් කැපීම ප්‍රදේශවාසීන්ම සිදුකරන බැවින් ඔවුන් රාජ්‍ය දේපල ආරක්ෂා කිරීම සඳහා වග විය යුතු බවට කරුණු අවධාරණය කරන ලදී. | පලාත් සභාවේ ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් නැවත විදුලිය ලබා දීම සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී. | ලේකම් දකුණු පලාත් ධීවර ...අමාත්‍යාංශය<br><br>නාගරික කොමසාරිස් හම්බන්තොට |
| iv | නව බස්රථ සේවාවක් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම | අම්බලන්තොට රොටවල මල්පෙත්තාව සිට සමාධිගම දක්වා බස් රථයක් ලබා දෙන ලෙස කරන ඉල්ලීම | මේ සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත්, ධාවනය සඳහා බස්රථයක් යෙදවීමට කටයුතු කරන බවට දැනුම් දෙන ලදී | අධ්‍යක්ෂ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දකුණු පළාත |
| v | මීගහජඳුර මාර්ගය සංවර්ධනය කිරීමේ දී පවරා ගත් ඉඩම් වලට වන්දි ගෙවීමේදී මතු වූ ගැටළු සම්බන්ධව | මෙම ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර ඇති බවත් වන්දි පරීක්ෂ සිදු කර වන්දි ගෙවීමෙ කටයුතු කරගෙන යන බවත් ප්‍රකාශ කරන ලදී. මාර්ගයට ඉඩම් අත්පත් කර ගැනීමේදී ඇතැම් පුද්ගලයින්ගේ නිවාස වලින් කොටසක් මාර්ග තැනීමේදී අත්පත් කර ගැනීමට සිදු වන බැවින් සම්පූර්ණ නිවසට තක්සේරුව ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව දන්වන ලදී.. නව අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන් මහාමාර්ග අමාත්‍යාංශයෙන් කරන ලද විමසීමක් අනුව නව අත්පත් කර ගැනීම් සිදු නොකරන ලෙස දන්වා ඇති අතර, ප්‍රදේශවාසීන් විසින් දිගින් දිගටම කරන ලද ඉල්ලීම් අනුව නැවත වරක් ඉඩම් අමාත්‍යාංශයට ලිඛිතව දැනුම් දුන් බවත්, තක්සේරු වන්දි පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් විමසීමේදී ගොඩනැගිලි කොටසක් කඩා ඉවත් | මෙවැනි ගැටලු ජාතික මට්ටමින් විසදා ගතයුතු බැවින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ යෝජනාවක් ලෙස ඉඩම් අමාත්‍යාංශයට දන්වන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |

හිමාල් ඉන්දුවිත් ද සිල්...
දිස්ත්‍රික් ලේකම් / දිසාප...
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීම වෙනුවෙන් එම කොටස යථාවත් කරණය කර ගැනීම සඳහා හානිපූර්ණයට ගෙන තක්සේරුව ගණනය කර දැන්වීමට නියමිත බව ඉඩම් අමාත්‍යංශය වෙත දන්වා ඇති බවට කරුණු ඉදිරිපත් කරන ලදී. එසේම පදිංචි නිවසක කොටසක් පවරා ගන්නේ නම් අනිවාර්යයෙන් නිවාසයේ පදිංචිකරුවන්ගේ කැමැත්ත තිබිය යුතු බවත් එසේ නොවන්නේ නම් පවරා නොගත යුතු බවට අදහස් ඉදිරිපත් විය. | | |
| 12 | **පසුව ලැබුණු ලිපි** | | | |
| | අස්වැසුම සමීක්ෂණය සඳහා ග්‍රාම නිලධාරීවරුන් වෙත ලබා දී ඇති තාක්ෂණික උපකරණ පිළිබඳ ගැටලු | මේ සඳහා ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ටැබ් පරිගණක ලබා දී ඇති බවත් , ඒවා වෙනත් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගන්නා ලෙස දන්වා ඇති බවත්, භාවිතයෙන් තොරව තැබීමේදී මෙම උපකරණ ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයකට පත්වන බවට අදහස් දක්වන ලදී. | මෙය දේශපාලන අධිකාරියේ මැදිහත්වීම මත සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු ප්‍රධානියා දැනුවත් කිරීම සුදුසු බවට උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් |
| | සංචාරක ව්‍යාපාරය සඳහා පාවෙන ගුවන්යානා තිස්සවැවට ගොඩ බැස්සවීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව | සංචාරක කර්මාන්තය දියුණු කිරීම කලයුතු බවත් මෙවැනි කටයුතු සිදු කිරීමේදී ජලජ ජීවීන් ඇතුළුව පරිසර පද්ධතියේම ආරක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීම අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. | ගොවි සංවිධාන සමග සාකච්ඡා කර විද්‍යාත්මක අධීක්ෂණයකින් පසු තීන්දුවක් ලබා දීමට තීරණය කරන ලදී. | අධ්‍යක්ෂ වාරිමාර්ග<br>ප්‍රා.ලේ. තිස්සමහාරාමය<br>සභාපති<br>රුහුණු සංචාරක කාර්යාංශය<br>ස.අධ්‍යක්ෂ<br>මධ්‍යම පරිසර අධිකාරිය |
| 13 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මතු වූ ගැටළු** | | | |
| i | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා සාමාජිකයින් ගේ පැමිණීම සම්බන්ධව | *රාජ්‍ය දැව සංස්ථාව සතුව යන්ත්‍රෝපකරණ සියල්ලම පැවතියත් දැව ඉවත් කිරීමේ රාජකාරී වලදී ඔවුන්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අල්ප බැවින් ඒ සම්බන්ධව අවධානය යොමු වියයුතු බවත් මෙම රැස්වීමට නොපැමිණීම සම්බන්ධව රාජ්‍ය දැව සංස්ථාවේ නිලධාරීන් ගෙන් විමසීම් කරන ලෙසත්,<br><br>*දිස්ත්‍රික්කය තුල කෘෂිකාර්මික ගැටළු විසඳීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවක් ක්‍රියාත්මක වෙමින් පවතින බැවින් නැවතත් එම කරුණු මෙම කමිටුවේදී සාකච්ඡා කිරීම අනවශ්‍ය බැවින් මෙම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වඩාත් ඵලදායී අයුරින් පැවැත්වීම සඳහා සියලුම ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් නියෝජිතයෙකු පමණක් මෙම කමිටුව සඳහා කැඳවන ලෙසත් දැනුම් දෙන ලදී | | දිස්ත්‍රික් ලේකම්<br><br>අධ්‍යක්ෂ කෘෂිකර්ම |
| ii | වලවේ ගඟේ මෝය කැපීම සම්බන්ධව | මෙම ප්‍රදේශයේ කුඹුරු අක්කර 2000ක් පමණ ජලයෙන් යටවෙන බැවින් මෝය කැපීම නිරන්තරයෙන් සිදු කිරීමට වන බවත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ ගොවීන් ගේ මැදිහත්වීමෙන් එය සිදු කරන බවත් පසුගිය දිනවල මෝය කැපීම ගොවීන්ගේ පෞද්ගලික | ආයතන සියල්ල සම්බන්ධ වී සාකච්ඡා කොට ස්ථිර විසඳුමක් ලබාගැනීම සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. | වාරිමාර්ග ඉංජිනේරු අම්බලන්තොට |



හිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| | | | | |
|---|---|---|---|---|
| | | වියදම්න් කිරීමට සිදුවීම නිසා මේ සඳහා ස්ථිර විසඳුමක් ලබාදෙන ලෙසට කරුණු ඉදිරිපත් කරන ලදි. මෝය කැපීම පට්ටියවරාය සහ ගොඩවාය යන ස්ථාන දෙකෙන් සිදු කරන අතර වර්ෂයකට 10-15 වතාවක් පමණ කැපීමට සිදුවන බවත් ද මේ පිලිබඳ මොරටුව විශ්වවිද්‍යාලයේ සිදුකල පර්යේෂණය අනුව ද මෝය කැපීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | | |

මෙම රැස්වීමේදී ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කර විසඳා ගැනීමට හැකි බොහෝ කරුණු ඉදිරිපත් වී ඇති බැවින් සියලුම ආයතන වෙත ඉදිරිපත් වන යෝජනා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කර විසඳුම් ලබා ගන්නා ලෙසත් එහිදි විසඳා ගැනීමට නොහැකි වූ කරුණු පමණක් ඉදිරියේ දී පැවැත්වෙන දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස සියලුම සාමාජිකයන් වෙත අවධාරණය කරමින් දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තූතිය පල කිරීමෙන් අනතුරුව පස්වරු 3.00 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 පෙබරවාරි මස 06

හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.